SO SRI LANKA

## 2021 දෙසැම්බර් 26 වැනි දින සමාජ මාධ්‍ය ඔස්සේ උදයංග වීරතුංග මහතා විසින් කරන ලද පදනම් විරහිත චෝදනා


කොරෝනා වසංගතය මුවාවෙන්, සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ රාජ්‍ය යන්ත්‍රණය නිසාම, මේ වසරේ දී රටට අහිමි වූ විදේශ විනිමය ඩොලර් බිලියන 3 කට ආසන්න බව අද බටහිර යුරෝපා සංචාරකයන්ගේ පැමිණීම මත ඔප්පු වී හමාරයි. එදා හිතුමතේ ට පැනවූ සංචාරකයන් ට අහිතකර රෙගුලාසි නැවතත් ක්‍රියාත්මක කිරීමට පටන් ගෙන ඇත. තම රටෙහි රක්ෂණයක් හිමි සංචාරකයන් ට පවා ලබන වසරේ පල වෙනිදා සිට සංචාරක මණ්ඩලයේ කොවිඩ්-19 රක්ෂණය අනිවාර්ය කිරීම මත පමණක් එක සංචාරකයකු වෙනුවෙන් ඩොලර් 3 ක කොමිස් මුදලක් බලධාරීන්ගේ සාක්කුවට ලැබෙන බව අද කවුරුත් දන්නා රහසකි. අත්‍යවශ්‍ය මොහොතේ යාන්තම ට හෝ රටට ගලා එන විදේශ විනිමය බහිරවිය ගෙන් ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම ලාංකික අපගේ අවාසනාව බව සටහන් කර තබමි.. උදයාංග වීරතුංග, රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති.
07:15

### 01. කොවිඩ්19 රක්ෂණය කුමක් සඳහාද?

ශ්‍රී ලංකාවට පැමිණීමේදී  වෙනත් බොහෝ රටවල් මෙන් වීසා නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් ලෙස අනිවාර්ය සංචාරක රක්ෂණයක් නොමැත. අනිවාර්ය සංචාරක රක්ෂණයක් ඇති අනෙකුත් රටවල් වන්නේ තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තායිලන්තය සහ යුරෝපා සංගමයයි.

කොවිඩ්19 ගෝලීය සෞඛ්‍ය වසංගතය අතරතුර ශ්‍රී ලංකාව තායිලන්තය මෙන් කොවිඩ්19 රක්ෂණයක් ක්‍රියාත්මක කළේ සංචාරකයින්ට ඔවුන් රැඳී සිටින කාලය තුළ කොවිඩ්19 වැළඳී ඇතැයි රෝග විනිශ්චය කළහොත් සියලු වියදම් පියවා ගත හැකි බව සහතික කිරීම සඳහා ය.

### 02. කොවිඩ්19 රක්ෂණයේ ප්‍රතිලාභ

සංචාරකයින් මාසයක කාලයක් සඳහා ඇමරිකානු ඩොලර් 50,000 දක්වා සම්පූර්ණයෙන් ආවරණය වන අතර, දැනට එහි වියදම ඇමරිකානු ඩොලර් 12 ක් පමණි. තායිලන්තයේ මේ සඳහා ඇමරිකානු ඩොලර් 120250 අතර වියදමක් වැය වේ.

**ඇතැමුන් මාසයක් සඳහා ඇ.ඩො. 12 ක පිරිවැය එනම් දිනකට රු. 80 ක් යන්න විශාල වැය බරක් ලෙස සලකනු ඇත. එයින් පැහැදිළි වන්නේ ඇතැමුන් සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නා රටට අගතියක් වන ක්‍රමෝපායන් වේ.**

සියලුම වෛද්‍ය වියදම් කොවිඩ්19 රක්ෂණය හරහා සිදු කරන බවට සංචාරකයින්ට සහතිකයක් ලබා දේ. බොහෝ සම්මත සංචාරක රක්ෂණ, කොවිඩ්19 ආවරණය නොකරන අතර, බොහෝ විට සංචාරකයාට කිසිදු ආවරණයක් නොමැති වේ.

කොවිඩ්19 රක්ෂණය, වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට අවශ්‍ය වුවහොත් සංචාරකයා ශ්‍රී ලංකා රජයට බරක් නොවන බව සහතික කරයි.

### 03. කොවිඩ්19 රක්ෂණයක් ලබා ගැනීමට තීරණය කිරීම

**සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කෝවිඩ් 19 රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ සංචාරක ඇමතිතුමන් සහ අමාත්‍යමණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ක්‍රමවේදයට අනුකූලවය.**

ගෝලීය සෞඛ්‍ය වසංගතයක බලපෑම පිළිබඳව විශ්වසනීයත්වයක් හෝ දැනුමක් නොමැති, සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකරන අසත්‍ය ප්‍රකාශවලට නොරැවටෙන ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ජනතාවගෙන් ඉල්ලා සිටියි.